සැ. යු. - 2013.03.22 දින පළ වූ අංක 1,803 දරන ගැසට් පත්‍රයේ IV (අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,804 - 2013 මාර්තු මස 28 වැනි බ්‍රහස්පතින්දා - 2013.03.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIආ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් .... ... ... | 470 | රජයේ නොවන දැන්වීම් ... ... ... | 472 |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — | රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | 436 | වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 477 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | — | විවිධ දැන්වීම් ... ... ... | — |


(i) ලක්ෂ්මන් වසන්ත පෙරේරා ප්‍රජා සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2012 නොවැම්බර් මස 16 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(ii) ග්ලෝබල් හසුමනිටේරියන් ෆවුන්ඩේෂන් (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2012 නොවැම්බර් මස 30 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(iii) එක්සත් මුස්ලිම් උම්මාහ් (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2012 දෙසැම්බර් මස 28 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2013 අප්‍රේල් මස 19 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2013 අප්‍රේල් මස 05 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

පී. එච්. එල්. වී. ද සිල්වා,
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.).*

2013 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

**ශ්‍රී ලංකා දුම්රිය සේවය**

ප්‍රසම්පාදන දැන්වීම

**ශ්‍රී ලංකා දුම්රිය සේවය වෙත කළුගල් බැලස්ට් කියුබ් 3,300 ක් සැපයීමේ ප්‍රසම්පාදනය**

කොළඹ 10 ශ්‍රී ලංකා දුම්රිය සේවයේ ප්‍රධාන දෙපාර්තමේන්තුවේ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති තැන විසින් පහත සඳහන් ස්ථාන වෙත කළුගල් පිරවුම් සැපයීම සඳහා 2013.04.03 දින ප.ව. 2.00 දක්වා මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ. පහත දැක්වෙන අයිතම වෙන් වෙන් වශයෙන් ඇගයීමට භාජනය කරනු ලබන අතර ප්‍රදානයද වෙන් වෙන් වශයෙන් සිදුකරනු ලැබේ.

| අයිතම අංක | භාරදිය යුතු ස්ථානය | කියුබ් ප්‍රමාණය | භාරදීම |
|---|---|---|---|
| 01 | මාහෝ | 1,000 | මාස 06 |
| 02 | අඹන්පොල | 200 | මාස 03 |
| 03 | තඹුත්තේගම | 200 | මාස 03 |
| 04 | අනුරාධපුරය | 1,000 | මාස 06 |
| 05 | මැදවච්චිය | 500 | මාස 04 |
| 06 | වවුනියාව | 200 | මාස 03 |
| 07 | පූනෑව | 200 | මාස 03 |

02. ආපසු නොගෙවන ලියවිලි ගාස්තුව වූ රු 3,000 ක් පමණක් ගෙවා, කොළඹ 10, ඕල්කට් මාවතේ, දුම්රිය ගබඩාවේ අධිකාරී කාර්යාලයෙන් 2013.04.02 දින ප.ව. 3.00 දක්වා ලබාගත හැකි ආකෘති මත සකස් කළ ලංසු පමණක් භාරගනු ලැබේ.

03. 2013.04.03 වැනි දින ප.ව. 2.00 ට ලංසු භාරගැනීම අවසන් කරනු ඇත.

04. ලංසු භාරගැනීම අවසන් කළ වහාම කොළඹ 10, ඕල්කට් මාවතේ, ශ්‍රී ලංකා දුම්රිය සේවා මූලස්ථාන කාර්යාලයේ දී එම ලංසු විවෘත කරනු ඇත. ලංසුකරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින්ට එම අවස්ථාවට සහභාගී වන ලෙස ඉල්ලා සිටිනු ලැබේ.

05. මුද්‍රා තබන ලංසු ලියාපදිංචි තැපෑලෙන් හෝ රැගෙනවිත් පහත ලිපිනයට යොමු කළ හැක.

සභාපති,
ප්‍රධාන දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,
ශ්‍රී ලංකා දුම්රිය සේවය,
දුම්රිය සේවා මූලස්ථානය,
ඕල්කට් මාවත, කොළඹ 10.

06. කොළඹ 10, ඕල්කට් මාවතේ, දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලයේ දී අයකිරීමකින් තොරව ලංසු ලියවිලි පරීක්ෂාව සිදුකළ හැකි අතර වැඩිමනත් තොරතුරු සඳහා, දුම්රිය ගබඩා අධිකාරී තැන හා දුරකථන අංක 2438078, හෝ 2436818 හා ෆැක්ස් අංක 2432044 ඔස්සේ සම්බන්ධ විය හැකිය.

සභාපති,
ප්‍රධාන දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,
ශ්‍රී ලංකා දුම්රිය සේවය.

යොමු අංක : SRS/F 7016

03-1185

**ශ්‍රී ලංකා දුම්රිය සේවය**

ප්‍රසම්පාදන දැන්වීම

**ශ්‍රී ලංකා දුම්රිය සේවයට කළුගල් බැලස්ට් කියුබ් 4,000 ක් සැපයීම සඳහා වන ප්‍රසම්පාදනය**

01. කොළඹ 10, ශ්‍රී ලංකා දුම්රිය සේවයේ, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ (ප්‍රධාන) සභාපති විසින් පහත සඳහන් ස්ථානවලට කළුගල් බැලස්ට් සැපයීම සඳහා 2013.04.03 වැනි දින ප.ව. 2.00 දක්වා මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ. පහත සඳහන් එක් එක් අයිතමය සඳහා වන මෙම ලංසු වෙන වෙනම ඇගයීමට ලක්කරමින් ප්‍රදානය කරනු ලැබේ.

| අයිතම අංකය | සැපයිය යුතු ස්ථානය | කියුබ් | ගෙනැවිත් භාරදීම |
|---|---|---|---|
| 01 | මඩකලපුව | 1,000 | මාස 06 යි |
| 02 | එරාවූර් | 500 | මාස 04 යි |
| 03 | වාලච්චේනයි | 1,000 | මාස 06 යි |
| 04 | පොළොන්නරුව | 1,000 | මාස 06 යි |
| 05 | හිඟුරක්ගොඩ | 500 | මාස 4 යි |

02. රුපියල් 3,000.00 ක ආපසු ගෙවනු නොලබන ලිපිලේඛන ගාස්තු ගෙවීමෙන් අනතුරුව 2013.04.02 දින ප.ව. 3.00 දක්වා කොළඹ 10, ඕල්කොට් මාවත, ශ්‍රී ලංකා දුම්රිය ගබඩාවේ අධිකාරී කාර්යාලයේ දී ලබාගත හැකි ආකෘති පත් මගින් පමණක් ලංසු ඉදිරිපත් කළ යුතුය.

03. 2013.04.03 දින ප.ව. 2.00 ට ලංසු භාරගැනීම අවසන් කෙරේ.

04. ලංසු භාරගැනීම අවසන් වූ වහාම කොළඹ 10, ඕල්කොට් මාවත, ශ්‍රී ලංකා දුම්රිය සේවයේ දුම්රිය සේවා මූලස්ථාන කාර්යාලයේ දී ලංසු විවෘත කරනු ලැබේ. ලංසු විවෘත කරන අවස්ථාවට පැමිණ සිටින මෙන් ලංසුකරුවන්ගේ හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින්ට ඇරයුම් කෙරේ.

05. මුද්‍රා තබන ලද ලංසු පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීමට හෝ අතින් ගෙනැවිත් භාර දිය යුතුය.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන),
ශ්‍රී ලංකා දුම්රිය සේවය,
දුම්රිය මූලස්ථානය,
ඕල්කොට් මාවත,
කොළඹ 10.

06. කොළඹ 10, ඕල්කොට් මාවත, දුම්රිය ගබඩා අධිකාරී තුමාගේ කාර්යාලයේ දී ලංසු ලිපිලේඛන නොමිලේ පරීක්ෂා කර බැලිය හැකි අතර වැඩි විස්තර දුම්රිය ගබඩා අධිකාරීතුමා වෙතින් දුරකථන අංක 2438078 හෝ 2436818 හා ෆැක්ස් අංක 2432044 මගින් ලබා ගත හැකිය.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන),
ශ්‍රී ලංකා දුම්රිය සේවය.

යොමු අංක : SRS/F.7013

03-1184

## මහාධිකරණය - බදුල්ල

### රාජසන්තක කරන ලද සහ හිමිකම් නොපාන ලද මෝටර් වාහන ටෙන්ඩර් මගින් විකිණීම - දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය - වැලිමඩ

වැලිමඩ දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ රාජසන්තක කරන ලද හා හිමිකම් නොපාන ලද පහත සඳහන් මෝටර් වාහන විකිණීම සඳහා ටෙන්ඩර් පත් පහත සඳහන් පරිදි කැඳවනු ලැබේ.

1. ටෙන්ඩර් පෝරම පත් නිකුත් කිරීම : 2013.04.08 දින සිට 2013.04.19 දින දක්වා

2. ටෙන්ඩර් පෝරම පත් භාර ගැනීම : 2013.04.24 දින ප.ව. 2.00 දක්වා

3. ටෙන්ඩර් පෝරම පත් විවෘත කිරීම : 2013.04.24 දින ප.ව. 2.30 ට බදුල්ල මහාධිකරණ, කාර්යාලයේ දී පැවැත්වේ.

4. *ටෙන්ඩර් පෝරම පත් එවිය යුතු ලිපිනය .-* "සභාපති" ටෙන්ඩර් මණ්ඩලය, ඌව පළාත්බද මහාධිකරණය, බදුල්ල" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් පමණක් 2013.04.24 දිනට පෙර එවිය යුතු අතර, ටෙන්ඩර් පත් බහාලන කවරයේ ඉහළ වම් පස කෙළවරේ " රාජසන්තක කරන ලද වාහන විකිණීම - දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය, වැලිමඩ'' ලෙස සඳහන් කර එවිය යුතුයි.

5. ටෙන්ඩර් පෝරම පත් බදුල්ල මහාධිකරණ කාර්යාලයෙන් ලබා ගත හැකි අතර, ටෙන්ඩර් මගින් විකිණීමට යෝජිත වාහනවල විස්තර හා ටෙන්ඩර් තැන්පත් මුදල ගෙවිය යුතු ආකාරය පහත දැක්වේ.

| | *වාහන වර්ගය හා විස්තරය* | *වාහන අංකය* | *අවම ලංසු මුදල* | *ටෙන්ඩර් ඇප තැන්පත්* | |
|---|---|---|---|---|---|
| | | | | *ආපසු නොගෙවන මුදල* | *ආපසු ගෙවන මුදල* |
| | | | *රු.* | *රු.* | *රු.* |
| 01. | සෙන්ට්‍රින් වර්ගයේ අත් ට්‍රැක්ටර් 01 ක්<br>GN12 - 815CC<br>නිෂ්පාදිත වර්ෂය : 2008<br>Fuel - Diesal | UPSI 8145 | 58,000 | 100 0 | 1,000 0 |
| 02. | බජාජ් වර්ගයේ ත්‍රීරෝද රථ 01 ක්<br>Auto RG 2Stroke 145.45CC<br>නිෂ්පාදිත වර්ෂය : 2005<br>Fuel - Petrol | UPQA 0081 | 1,70,000 | 100 0 | 2,000 0 |
| 03. | බජාජ් වර්ගයේ ත්‍රීරෝද රථ 01 ක්<br>Auto RG 2 Stroke 150 CC<br>නිෂ්පාදිත වර්ෂය : 2003<br>Fuel - Petrol | UPHC 2025 | 1,60,000 | 100 0 | 2,000 0 |
| 04. | ISUZU වර්ගයේ ත්‍රීරෝද රථ 01 ක්<br>ELF 4570 CC<br>නිෂ්පාදිත වර්ෂය : 2006<br>Fuel - Diesal | CPLC 5275 | 14,50,000 | 100 0 | 10,000 0 |

02. වාහන පරීක්ෂාව වැලිමඩ දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය මත 2013.04.01 දින සිට 2013.04.19 දින දක්වා කාර්යාල වේලාවන් තුළ දී වැලිමඩ, දිසා/මහෙස්ත්‍රාත් අධිකරණ භූමියේ දී සිදු කල හැකිය.

03. බදුල්ල මහාධිකරණයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිගේ තීරණය අවසාන තීරණය වේ.

සම්පත් බී. අභයකෝන්,
මහාධිකරණ විනිසුරු.

2013 මාර්තු 11 වැනි දින,
බදුල්ල, ඌව පළාත්බද මහාධිකරණයේ දී ය.

03-1094

# රජයේ නොවන දැන්වීම්

## ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 8 වැනි වගන්තියෙහි විධිවිධානයන්ට අනුව බාම් හොලිඩේ හෝම්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් ස්වකීය නාමය ඇග්රි සේෆ් ප්‍රොඩක්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් ලෙස 2010 මැයි මස 21 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි වෙනස් කළ බව පෙර කී පනතෙහි 9 (2) වගන්තිය ප්‍රකාරව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නව නාමය : ඇග්රි සේෆ් ප්‍රොඩක්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී. වී. 69706
ලියාපදිංචි කළ කාර්යාලය : අංක 52, මාකස් ප්‍රනාන්දු මාවත, කොළඹ 07.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

කෝපරේට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ඇග්රි සේෆ් ප්‍රඩක්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

03-1164/1

---

## නිවේදනයයි

ඩාර්විෂ් ට්‍රේඩිං (ප්‍රයිවට්) ලිමිටඩ් 2007 අගෝස්තු මස 24 වැනි දින සංස්ථාපනය කරන ලද බව 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාර මෙයින් නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නම : ඩාර්විෂ් ට්‍රේඩිං (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගමේ අංකය : පී වී 60721
ලියාපදිංචි කාර්යාලය : වැලියන්ට් ටවර්ස්, ලෙවල් 2 සී, 46/7, නවම් මාවත, කොළඹ 02.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

කෝපරේට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

03-1164/2

---

## නිවේදනයයි

ඒ. ජී. එස්. ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් 2007 ජූලි 24 වැනි දින සංස්ථාපනය කරන ලද බව 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාර මෙයින් නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නම : ඒ. ජී. එස්. ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගමේ අංකය : පී වී 64952
ලියාපදිංචි කාර්යාලය : අංක 216 ද සේරම් පෙදෙස, කොළඹ 10.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

කෝපරේට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

03-1164/3

---

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9(1) වගන්තිය යටතේ පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බව මෙයින් දන්වමු.

ලියාපදිංචි සමාගමේ නම : වෙරිටේ රිසර්ච් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 72318
ලියාපදිංචි කළ දිනය : 2010.05.14
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 32, ආර්තුසා පටුමග, කොළඹ 06.

ෆයිනෑන්ෂියල් ඇන්ඩ් බිස්නස් ඇසෝසියේට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

03-1161/1

---

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9(1) වගන්තිය යටතේ පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බව මෙයින් දන්වමු.

ලියාපදිංචි සමාගමේ නම : ද පාර්ටී ස්ටේෂන් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 91370
ලියාපදිංචි කළ දිනය : 2013.03.06
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 1 /ජී, එෆ් 4, 282 ආර් ඒ ද මැල් මාවත, කොළඹ 03.

ෆයිනෑන්ෂියල් ඇන්ඩ් බිස්නස් අසෝසියේට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

03-1161/2

---

## ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9(2) වැනි වගන්තිය ප්‍රකාරව වෝටර් කෙයා ලැබොරටරි සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ් සිය නාමය 2013 පෙබරවාරි මස 08 වැනි දින සිට වෙනස් කොට ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ පූර්ව නාමය : වෝටර් කෙයා ලැබොරටරි සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ ලියාපදිංචි අංකය : පී වී 11535,
සමාගමේ නව නම : වෝටර්කෙයා ටෙක්නොලොජිස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි කාර්යාලය : අංක 104, පොල්වත්ත, පන්නිපිටිය. 10230.

ලේකම්වරු.

03-1179

### දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9(1) වැනි වගන්තිය ප්‍රකාරව සමාගමක් සංස්ථාගත කිරීම පිළිබඳවයි.

සමාගමේ නාමය : වින්ස් ලංකා ඉංජිනියරින් (පීවීටී) එල්ටීඩී
සමාගමේ අංකය : පී වී 91097
ලියාපදිංචි දිනය : 2013.02.18
ලියාපදිංචි ලිපිනය : අංක 293/බී, මීගමු පාර, දෙහියාගාත, දඩුගම, ජාඇල.

ලේකම්වරුන්.

03-1178

---

### දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9(1) වන වගන්තිය ප්‍රකාර ව සමාගමක් සංස්ථාගත කිරීම පිළිබඳවයි.

සමාගමේ නාමය : සිසර් ලැබොරටරි සර්විසස් (පීවීටී) එල්ටීඩී
සමාගමේ අංකය : පී වී 91269
ලියාපදිංචි දිනය : 2013.02.28
ලියාපදිංචි ලිපිනය : අංක 42/12, නාලක අමරසිංහ පෙදෙස, සොලමන් මාවත, පානදුර.

අධ්‍යක්ෂ.

03-1171

---

### දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9(1) වගන්තිය ප්‍රකාරව සමාගමක් සංස්ථාගත කිරීම පිළිබඳවයි.

සමාගමේ නාමය : අමාෂි ස්පා (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 63949
ලියාපදිංචි දිනය : 2008.04.29
ලියාපදිංචි ලිපිනය : අංක 32/12/01/01, සංඝරාජවත්ත, නුවර.

ලේකම්වරුන්.

03-1170

---

### වගකීමෙන් සීමිත සමාගමක් සංස්ථාගත කිරීම පිළිබඳ ප්‍රසිද්ධ නිවේදනයයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9(1) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාගත කිරීම පිළිබඳ අප විසින් මෙයින් නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නම : හෙලිකොන් (පීවීටී) එල්ටීඩී
සමාගමේ අංකය : පී වී 91458
ලියාපදිංචි කළ දිනය : 2013.03.12
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 16, පන්සල පාර, මීගමුව.

හෙලිකොන් (පීවීටී) එල්ටීඩී සඳහා සහ වෙනුවෙන්,
පී ඩබ්ලිව් කෝපරේට් සෙක්‍රටේරියල් (පීවීටී) එල්ටීඩී
සමාගම් ලේකම්වරුන්.

2013 මාර්තු මස 15 වැනි දින.

03-1169

---

### නිවේදනයයි

පහත සඳහන් සමාගම 2012.12.19 වැනි දින සංස්ථාපනය කරන ලද බව 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය ප්‍රකාරව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නම : සීමාසහිත ප්‍රැඩන්ස් එඩියුසර්විසස් (පුද්ගලික) සමාගම
සමාගමේ අංකය : පී. වී. 90038
ලියාපදිංචි කාර්යාලය : "බර්ඩ්ලයින්" අංක 169, කොටුගොඩ පාර, සීදූව

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝගය පරිදි,

සීමාසහිත බිස්නස් සෙකටේරියල් සර්විසස්
(පෞද්ගලික) සමාගම,
සමාගම් ලේකම්වරු - පී. වී. 13045

03-1096/1

---

### නිවේදනයයි

පහත සඳහන් සමාගම 2013.01.16 වැනි දින සංස්ථාපනය කරන ලද බව 2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වැනි වගන්තිය ප්‍රකාරව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නම : ජේ. ඩබ්ලිව්. පී. ග්ලෝබල් ට්‍රේඩිං (පුද්ගලික) සමාගම
සමාගමේ අංකය : පී. වී. 90539
ලියාපදිංචි කාර්යාලය : අංක 119/B රොබට් ගුණවර්ධන මාවත, බත්තරමුල්ල.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝගය පරිදි,

සීමාසහිත බිස්නස් සෙකටේරියල් සර්විසස්
(පෞද්ගලික) සමාගම,
සමාගම් ලේකම්වරු - පී. වී. 13045

03-1096/2

---

### සමාගමේ නාමය වෙනස් කිරීම පිළිබඳ ප්‍රසිද්ධ නිවේදනයයි

පහත සඳහන් සමාගමේ නම 2013 පෙබරවාරි මස 18 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි 2007 අංක 07 දරන සමාගම් පනත 8 වැනි වගන්තියට අනුගාමීව වෙනස් කරන ලද බව එම පනතේ 9(2) වගන්තියට අනුගාමීව මෙයින් ප්‍රසිද්ධියේ නිවේදනය කරනු ලැබේ.

සමාගමේ කලින් තිබූ නම : මාර්ල්බෝ (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී.වී. 13264
ලිපිනය : එස්. ජී. ආර්කේඩ්, දෙවන මහල, අංක 441/7, ශ්‍රී සංඝරාජ මාවත, කොළඹ 10.
නව නාමය : මාර්ල්බෝ ප්‍රොජෙක්ට්ස් (පුද්ගලික) සමාගම.

ලෙගසෙ සර්විසස් ප්‍රයිවට් ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

අංක 15, ප්‍රැන්ක්පර්ඩ් පෙදෙස,
කොළඹ 04.

03-1097

### කීඑම් එක්ස්පෝර්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වගන්තිය යටතේ සංස්ථාගත කිරීම පිළිබඳ ප්‍රසිද්ධ දැන්වීම

2013 මාර්තු 1 වන දින සමාගම් ලියාපදිංචි අංක පීවී 91242 යටතේ "කීඑම් එක්ස්පෝර්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්" යන නාමය යටතේ නව සමාගමක් සංස්ථාගත කරනු ලැබ ඇති බව සහ එහි ලියාපදිංචි කාර්යාලය, අංක 53/1, ධර්මපාල මාවත, කොළඹ 03 යන ස්ථානයේ බව අපි මෙයින් මහජනතාවට දැනුම් දෙමු.

එම්. ඇන්ඩ්. ඒ කම්පනි සෙක්‍රටරීස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
(සමාගමේ ලේකම්වරු).

අංක 28, (2 වන තලය),
ඩබ්ලිව්. ඒ. ඩී. රාමනායක මාවත,
කොළඹ 02.

03-1092

---

### විලියම් ඉන්වෙස්ට්මන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්

(පෙර ඩබ්ලිව් ඇන් පී. ඉන්වෙස්ට්මන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
(සමාගමේ ලියාපදිංචි අංකය :පී. වී. 89876)

**2007 අංක 07 දරන සමාගම් පනතේ 9(2) අනුකූලව පහත සඳහන් නම වෙනස් කිරීම පිළිබඳ දැන්වීම**

2007 අංක 07 දරන සමාගම් පනතේ 8 වන වගන්තියේ විධිවිධාන වලට අනුකූලව 2012 පෙබරවාරි 21 වන දින සිට ඩබ්ලිව් ඇන්. පී. ඉන්වෙස්ට්මන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් (පෙර නාමය) එහි නාමය විලියම් ඉන්වෙස්ට්මන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් (නව නාමය) යනුවෙන් වෙනස් කොට ඇති බවත්, එහි ලියාපදිංචි කාර්යාලය, අංක 28, (2 වන තලය) ඩබ්. ඒ. ඩී. රාමනායක මාවත, කොළඹ 02 යන ස්ථානයේ බව අපි මෙයින් මහජනතාවට දැනුම් දෙමු.

එම්. ඇන්ඩ් ඒ කම්පනි සෙක්‍රටරීස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
(සමාගමේ ලේකම්වරු).

අංක 28, (2 වන තලය),
ඩබ්ලිව්. ඒ. ඩී. රාමනායක මාවත,
කොළඹ 02.

03-1091

---

### සමාගම් සංස්ථාපනය කිරීමේ ප්‍රසිද්ධ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් ආඥාපනතේ 9(1) වැනි වගන්තිය ප්‍රකාර කරනු ලබන නිවේදනයයි

පහත සඳහන් සමාගම සංස්ථාපනය කර ඇති බව මෙයින් දැනුම් දෙමු.

සමාගමේ නම : රීගල් ආයෝජන (පෞද්ගලික) සමාගම
සමාගමේ අංකය : 81883
ලියාපදිංචි කල දිනය : 2011.10.06
සමාගමේ ලිපිනය : අංක 64/1, හලාවත පාර, මානවේරිය, කොච්චිකඩේ,
ඉදිරිපත් කිරීම : සමාගම් ලේකම්.

03-1090

### ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාගත කොට ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නාමය : ජේ. එස්. එල්. ඉම්පෙක්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සංස්ථාගත කළ දිනය : 2012 පෙබරවාරි 08
සමාගමේ අංකය : පීවී 84147
ලියාපදිංචි කාර්යාලය : අංක 34/1/2, වෙල්ල වීදිය, කොළඹ 12

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි.

03-1074

---

### සමාගමේ නම වෙනස් කිරීම

2007 අංක 07 දරන සමාගම් පනතේ අංක 9(2) වැනි වගන්තියට අනුව සමාගමේ නම වෙනස් කිරීම සම්බන්ධයෙන් පහත සඳහන් විස්තර දැන්වීමක් මගින් ප්‍රසිද්ධ කරනු ලැබේ.

1. සමාගමේ කලින් නම : සිලෝන් ට්‍රස්ට් ඉන්වෙස්ට්මන්ට් ඇන්ඩ් ෆිනෑන්ස් කම්පැණි (ප්‍රයිවට්) ලිමිටඩ්
2. සමාගමේ අංකය : පී වී 13182
3. සමාගමේ ලියාපදිංචි කල කාර්යාලයේ ලිපිනය : අංක 129/1/2, ඩී. එස්. සේනානායක වීදිය, මහනුවර.
4. සමාගමේ අලුත් නම : සිලෝන් ට්‍රස්ට් ඉන්වෙස්ට්මන්ට් ඇන්ඩ් රියල් එස්ටේට් කම්පැණි (පීවීටී) එල්ටීඩී

03-1072

---

### නිවේදනයයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වන වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බවට මෙයින් දන්වමු.

සමාගමේ නම : අවුරෝරා ටුවර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී. වී. 88565
සංස්ථාපිත දිනය : 2012.10.01
ලියාපදිංචි කාර්යාලය : අංක 400, ඩී. ආර්. විජේවර්ධන මාවත, කොළඹ 10

03-1070

---

### දැන්වීමයි

වර්ෂ 2007 අංක 07 දරන නව සමාගම් පනතේ 09)(01) වන වගන්තිය ප්‍රකාරව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නම : JST AQUARIA (PVT) LTD
ලියාපදිංචි අංකය : PV 91114
සංස්ථාගත කළ දිනය : 2013.02.18
ලියාපදිංචි ලිපිනය : අංක 104, කටාන පාර, තිඹිරිගස්කටුව,
සමාගම් ලේකම් : නිශ්ශංක සමන් ප්‍රියන්ත ද සිල්වා

03-1051

## ෆ්ලයිබෘනයි (ප්‍රයිවට්) ලිමිටඩ්

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වගන්තිය යටතේ සංස්ථාගත කිරීම පිළිබඳව මහජනතාවට කෙරෙන දැනුම්දීමයි.

2009 නොවැම්බර් මස 25 වැනි දින සමාගම් ලියාපදිංචි අංක පීවී 70127 යටතේ ෆ්ලයිබෘනයි (ප්‍රයිවට්) ලිමිටඩ් යන නාමය යටතේ නව සමාගමක් සංස්ථාගත කරනු ලැබ ඇති බව සහ නව සමාගමේ ලියාපදිංචි කාර්යාලීය ලිපිනය කොළඹ 03, ඞීල් පෙදෙස, අංක 2, එම් ඇන්ඩ් එන් ගොඩනැගිල්ල (5 වන තලය) හි, බව අපි මෙයින් මහජනතාවට දැනුම් දෙමු.

කන්දයියා නීලකන්ඩන්,
සභාපති.
එම් ඇන්ඩ් එන් ඒජන්ට්ස් ඇන්ඩ්
සෙක්‍රටරීස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
(සමාගමේ සමාගම් ලේකම්වරු).

එම් ඇන්ඩ් එන් ගොඩනැගිල්ල,
(5 වන තලය),
අංක 2, ඞීල් පෙදෙස,
කොළඹ 03.

03-1060

---

## ප්‍රසිද්ධ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාරව පහත සමාගම සංස්ථාගත කිරීම පිළිබඳව මෙයින් දැනුම් දෙමි.

සමාගමේ නම : සැනිකෙයා සර්විසස් (පීවීටී) එල්ටීඩී
සමාගමේ අංකය : පී. වී. 70067
ලියාපදිංචි දිනය : 2009.11.20
ලියාපදිංචි ලිපිනය : අංක 21, ආතර්ස් පෙදෙස, කල්දමුල්ල, මොරටුව.

අධ්‍යක්ෂ.

03-1111

---

## ප්‍රසිද්ධ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් ආඥාපනතේ 9 වැනි වගන්තිය ප්‍රකාරව පහත සමාගම සංස්ථාගත කළ බව මෙයින් දැනුම් දෙමි.

සමාගමේ නම : සීජීඅයි ඔටෝ වීල්ස් (පීවීටී) එල්ටීඩී
සමාගමේ අංකය : පී වී 90369
ලියාපදිංචි කළ දිනය : 2013.01.07
ලියාපදිංචි ලිපිනය : අංක 72, කොළඹ පාර, වේරහැර, බොරලැස්ගමුව.

සමාගම් ලේකම්.

03-1110

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වගන්තියෙහි විධිවිධාන යටතේ, පහත විස්තර දැක්වෙන ආයතනය සීමාසහිත සමාගමක් ලෙස සංස්ථාගත කරන ලදී.

සමාගමේ නම : ජේඩ් පැලස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී. වී. 89932
සංස්ථාගත කළ දිනය : 2012 දෙසැම්බර් මස 14 වැනි දින
ලියාපදිංචි කාර්යාලය : අංක 120, මීගමුව පාර, දඬුගම, ජාඇල.

අධ්‍යක්ෂ.

03-1108

---

## දැන්වීමයි

ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

අංක 32, උද්‍යාන මාවත, ගංගොඩවිල, නුගේගොඩ හි පදිංචි හංවැල්ලගේ කසුන් ඩයස් වන මම ගංගොඩවිල ප්‍රසිද්ධ නොතාරිස් යූ. එල්. ප්‍රේමවතී මිය විසින් 2010.05.05 වැනි දින ලියා සහතික කරන ලද අංක 2360 දරන ඇටෝර්නි බලපත්‍රය මගින් ඇටෝර්නි බලකරු ලෙස අංක 32, උද්‍යාන මාවත, ගංගොඩවිල, නුගේගොඩ පදිංචි හංවැල්ලගේ සරත් ඩයස් නමැති අයට ලබා දී ඇති අයිතිවාසිකම් බලපුළුවන්කාරකම් සහ බලතල 2013.02.15 වැනි දින පටන් බලරහිත සහ ශුන්‍ය වන බව මෙයින් ප්‍රකාශ කර සිටිමි.

හංවැල්ලගේ කසුන් ඩයස්.

03-1107

---

## ප්‍රසිද්ධ දැන්වීමයි

පහත සඳහන් සමාගම සංස්ථාගත කිරීම පිළිබඳව 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නම : ස්ලික් ලයින් ඇපරල්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 78535
ලියාපදිංචි කාර්යාලය : අංක 23/1, ලූඩ්ස් ඇවනිව්, ජාඇල.

අධ්‍යක්ෂ.

03-1104

---

## නිවේදනයයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වගන්තිය යටතේ සදර්න් මිනි හයිඩ්‍රෝ පවර් (ප්‍රයිවට්) ලිමිටඩ් යන සමාගම සීමාසහිත පෞද්ගලික සමාගමක් වශයෙන් වර්ෂ 2010ක් වූ පෙබරවාරි මස 03 වැනි දින ලියාපදිංචි කරන ලදී.

සමාගමේ නම : සදර්න් මිනි හයිඩ්‍රෝ පවර් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 70908
සමාගමේ ලියාපදිංචි කාර්යාලය : අංක 143/17, ශ්‍රී වික්‍රම මාවත, කොළඹ 15

අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය පරිදි,

කෝ- සර්ව් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලියාපදිංචි ලේකම්වරු.

03-1020

**දැන්වීමයි**

2007 අංක 07 දරන සමාගම් පනත

**සයුරි ලංකා ඉන්ටනැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ් - පී වී 90478**

ඉහත සඳහන් සමාගම 2013 ජනවාරි මස 10 වැනි දින සංස්ථාගත කළ බව සහ එහි ලියාපදිංචි කාර්යාලය අංක 102/176, මත්තෙගොඩ පාර, මත්තෙගොඩ යන ලිපිනයේ පවත්වාගෙන යන බව 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ මින් දැනුම් දෙමු.

ලීගල් ඇන්ඩ් කෝපරේට් කන්සන්ටන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

අංක 156 1/8 අළුත්කඩේ වීදිය,
කොළඹ 12.

03-1007

---

**දැන්වීමයි**

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වගන්තිය යටතේ පහත සඳහන් සමාගම සංස්ථාපනය කරන ලදී.

සමාගමේ නම : නිව් භාග්‍යා ඉන්ටර්නැෂනල් (පී වී ටී) එල් ටී ඩී
සමාගමේ ලියාපදිංචි අංකය : පී වී 74290
ලියාපදිංචි කළ දිනය : 2010.10.01
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 103/38, පළමු මහල, පොලිස් පාර, මාවතගම.

අධ්‍යක්ෂ අණ පරිදි,

වී ටී එල් මැනේජ්මන්ට් සර්විසස් (පී වී ටී) එල් ටී ඩී,
සමාගම් ලේකම්වරු.

03-1002/1

---

**දැන්වීමයි**

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වගන්තිය යටතේ පහත සඳහන් සමාගම සංස්ථාපනය කරන ලදී.

සමාගමේ නම : කැපිටල් ලීසිං ඇන්ඩ් ඉන්වෙස්ට්මන්ට් (පී වී ටී) එල් ටී ඩී
සමාගමේ ලියාපදිංචි අංකය : පී වී 91150
ලියාපදිංචි කළ දිනය : 2013.02.20
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : චාර්ල්ස් විලියම් මාවත, අංක 668/බී, වෙන්නප්පුව.

අණ පරිදි,

අධ්‍යක්ෂ.

වී ටී එල් මැනේජ්මන්ට් සර්විසස් (පී වී ටී) එල් ටී ඩී,
සමාගම් ලේකම්වරු.

03-1002/2

---

**දැන්වීමයි**

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වගන්තිය යටතේ පහත සඳහන් සමාගම සංස්ථාපනය කරන ලදී.

සමාගමේ නම : එල්. ඒ. ඩබ්ලිව් ඉන්වෙස්ට්මන්ට් (පී වී ටී) එල් ටී ඩී
සමාගමේ ලියාපදිංචි අංකය : පී වී 90735
ලියාපදිංචි කළ දිනය : 2013.01.29
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 472 එච්. දිවුලපිටිය.

අධ්‍යක්ෂ අණ පරිදි,

වී ටී එල් මැනේජ්මන්ට් සර්විසස් (පී වී ටී) එල් ටී ඩී,
සමාගම් ලේකම්වරු.

03-1002/3

---

**දැන්වීමයි**

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වගන්තිය යටතේ පහත සඳහන් සමාගම සංස්ථාපනය කරන ලදී.

සමාගමේ නම : නෙත්මි ඉන්වෙස්ට්මන්ට් (පී වී ටී) එල් ටී ඩී
සමාගමේ ලියාපදිංචි අංකය : පී වී 91224
ලියාපදිංචි කළ දිනය : 2013.02.26
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 432, ඥාණාවාස මාවත, දිවුලපිටිය.

අධ්‍යක්ෂක අණ පරිදි,

වී ටී එල් මැනේජ්මන්ට් සර්විසස් (පී වී ටී) එල් ටී ඩී,
සමාගම් ලේකම්වරු.

03-1002/4

---

**නිවේදනයයි**

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාපනය කිරීම නිවේදනය කරමි.

සමාගමේ නම : ඇකෝකැන්ඩි හොටේල්ස් ඇන්ඩ් රිසෝට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 91187
සංස්ථාගත කිරීමේ දිනය : 2013 පෙබරවාරි 23
සමාගමේ ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 855 සී, සිරිමාවෝ බණ්ඩාරනායක මාවත, මහනුවර.

අධ්‍යක්ෂ.

03-1036

**සංස්ථාගත කිරීම පිළිබඳ දැන්වීමයි**

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වගන්තිය ප්‍රකාරව කරනු ලබන දැන්වීමයි.

සමාගමේ නාමය : ද ලක්ෂරි ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ්

ලියාපදිංචි අංකය : පී වී 84669

ලියාපදිංචි ලිපිනය : 49 ඒ, ලියනගේ පාර, දෙහිවල.

සංස්ථාගත කළ දිනය : 2012 මාර්තු 02.

සමාගමේ ලේකම්.

03-1143

**දැන්වීමයි**

2007 අංක 07 දරන සමාගම් පනතේ 8 වගන්තිය ප්‍රකාර ශ්‍රී ලංකා එස්ටේට් බංගලෝස් (පීවීටී) එල්ටීඩී සමාගමේ නම එෆ් එල් සී එස්ටේට් බංගලෝස් (පීවීටී) එල්ටීඩී වශයෙන් නම වෙනස් කිරීම 2013 පෙබරවාරි මස 20 වැනි දින සංස්ථාපනය කිරීම පිළිබඳව මෙයින් දැනුම් දෙන්නෙමු.

සමාගමේ පෙර පැවති නම : ශ්‍රී ලංකා එස්ටේට් බංගලෝස් (පීවීටී) එල්ටීඩී

සමාගමේ අංකය : පී වී 77342

ලියාපදිංචි ලිපිනය : ලෙවල් 3, ප්‍රින්ස් ඇල්ෆ්‍රඩ් ටවර්, 10, ඇල්ෆ්‍රඩ් හවුස් ගාඩන්ස්, කොළඹ 03

සමාගමේ නව නාමය : එෆ් එල් සී එස්ටේට් බංගලෝස් (පීවීටී) එල්ටීඩී.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝග ප්‍රකාර,

සිලෝන් සෙක්‍රටේරියල් සර්විස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

03-1035

**විශේෂ ඇටර්නි බලය අවලංගු කිරීමේ නිවේදනය**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මහනුවර, පේරාදෙනිය පාරේ, අංක 436/1/1/1 හි පදිංචි, ජාතික හැඳුනුම්පත් අංක 636882852 V හිමි, හමීඩ් ෂෙරිෆ්ඩීන් රාසියා බෙගම් ෂිහාබ්ඩීන් වන මා විසින් මාතලේ, ප්‍රසිද්ධ (මහජන) නොතාරිස් එම්. එන්. ෆාතිමා රියාසා විසින් ලියා සහතික කරන ලද 2008.05.30 දාතම දරන හා අංක 06 දරන විශේෂ ඇටර්නි බලපත්‍රය මගින් මහනුවර පේරාදෙණිය පාරේ, අංක 436/1/1/1 හි පදිංචි මොහොමඩ් සාවාහිර් හම්සා යන අය වෙත, ප්‍රදානය කරන ලද ඇටර්නිබලය, මෙයින් වහාම ක්‍රියාත්මක වන ලෙස ප්‍රත්‍යාදිෂ්ඨ කොට අහෝසි කොට අවලංගු කරන ලද බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජ ආණ්ඩුවටත් සෙසු මහජනතාවටත් මෙයින් දන්වා සිටිමි.

රාසියා බෙගම්.

03-1134

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

**සම්පත් බැංකුව පීඑල්සී**
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින් වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

එම්. එන්. නසිර් සහ බෙල්කෝ ඒෂියා.
ගිණුම් අංක : 1036 5320 7954 සහ 0089 1000 0188

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2013.01.24 දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් අනූ දෙලක්ෂ හතලිස්හය දහස් හත්සිය හතලිස් හයයි ශත විසි එකක (රු. 92,46,746.21) මුදල ද, 2013 ජනවාරි 11 වැනි දින සිට අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් තුන් ලක්ෂ විසිනම දහස් හයසියයක (රු 3,29,600) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දොළහක් (12%) රුපියල් විසි දෙලක්ෂ දහ අට දහස් තුන්සිය අසූවයි ශත අසූපහක (රු. 22,18,380,85) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහසයක් (16%) හා තවත් රුපියල් හැට ලක්ෂ විසි හයදහස් එකසිය එකොළහයි ශත විස්සක (රු. 60,26,111.20) මුදලක් සඳහා වාර්ෂිකව සියයට විසිතුනක් (23%) බැගින් වූ පොලිය ද දැන්වීම් ගාස්තු ද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ වෙනත් ගාස්තු ද, තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2013.03.01 වැනි දින *රජයේ ගැසට් පත්‍රයේ* 2013.02.18 වැනි දින "දිවයින" සහ "තිනකුරල්" සහ "අයිලන්ඩ්" දිනපතා ප්‍රවෘත්තිපත්‍රවල පළකොට ඇති පරිදි 2013.04.30 දින පෙ. ව. 10.30 ට පිහිටි ස්ථානයේ දී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ දෙහිවල ගල්කිස්ස මහ නගර සභා සීමාවන් තුළ අත්තිඩිය

පිහිටි අත්තිඩිය පාර වරිපනම් අංක 191/1 දරන ගලබොඩවත්ත යයි කියනු ලබන ඉඩමට (බලයලත් මානක තැන ඩබ්ලිව්. අහංගම යන අය විසින් සාදන ලද 1987 නොවැම්බර් මස 04 දාතම හා අංක 3990 දරන පිඹුරේ නිරූපිත ලොට් 2 උපබෙදුමක් සහ නැවත මිනුමක් වන) බලයලත් මානක තැන ජේ. එම්. ඩබ්ලිව්. සමරනායක යන අය විසින් සාදන ලද (2004 මැයි මස 04 වැනි දින සත්‍ය පිටපතක් ලෙස සහතික කරන ලද) 2003 මාර්තු 29 දාතම හා අංක 1843 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන් කොට ලොට් 2 ඒ වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : අඩි 10 පළල පාර, (අංක 3990 දරන පිඹුරේ ලොට් 4), නැගෙනහිරට : ලොට් 2 බී, දකුණට : ජී කරෝලිස් පෙරේරා යන අයගේ දේපළ සහ බස්නාහිරට : අංක 3990 දරන පිඹුරේ ලොට් 3 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් හතයි දශම පහක් (අ. 0 රූ. 0 පර්. 7.5) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන්, ප්‍රවශතාවයන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 1843 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව එම් 3341/101 යටතේ දෙල්කඳ/නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

බලයලත් මානක තැන ඩබ්ලිව්. අහංගම යන අය විසින් සාදන ලද 1987 නොවැම්බර් මස 12 දාතම හා අංක 3990 දරන පිඹුරේ නිරූපිත ලොට් 4 වශයෙන් ලකුණු කොට ඇති මාර්ගය (අඩි 10 පළල පාර සඳහා වෙන්කිරීම) දිගේ හා ඒ මතින් ගමන් කිරීමේ හා මාර්ග අයිතිය ද සමග ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

03-1186/1

---

**සම්පත් බැංකුව පීඑල්සී**
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

ඇන්තන් ට්‍රේඩින් කම්පැණි (ප්‍රයිවට්) ලිමිටඩ්.
ගිණුම් අංකය : 0009 1000 5669.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2013.01.24 දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් පන්කෝටි තිස් එක් ලක්ෂ පනස් තුන් දහස් තුන්සිය පනස් පහයි ශත පනස් හතරක (රු. 5,31,53,355.54) මුදල ද, 2012 නොවැම්බර් මස 08 වැනි දින සිට අයවියයුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් හාර කෝටි අනූ නම ලක්ෂ අනූ නම දහස් නමසිය හතලිස් දෙකයි ශත හැට තුනක (රු. 4,99,99,942.63) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහ හතක් (17%) බැගින් වූ පොලිය ද, දැන්වීම් ගාස්තු ද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ වෙනත් ගාස්තු ද, තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2013.03.01 වැනි දින රජයේ ගැසට් පත්‍රයේ 2013.02.18 දින "දිවයින" සහ "තිනකුරල්" සහ "අයිලන්ඩ්" දිනපතා ප්‍රවෘත්තිපත්‍රවල පළකොට ඇති පරිදි 2013.04.23 දින පෙ. ව. 10.30 ට පිහිටි ස්ථානයේ දී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, මහ නගර සභා සීමාවන් තුළ දකුණු කොච්චිකඩේ වෝඩ් අංක 19 පිහිටි පරණ යොන් වීදිය වරිපනම් අංක 193 (කොටසක්) දරන බලයලත් මානක තැන එස්. එච්. බී. ජෝශප් යන අය විසින් සාදන ලද 1984 දෙසැම්බර් මස 11 දාතම හා අංක 62/84 දරන පිඹුරේ නිරූපිත ඉඩම් කොටසේ උප බෙදුමක් සහ නැවත මිනුමක් වන ඉඩමට බලයලත් මානක තැන පී. සින්නතම්බි යන අය විසින් සාදන ලද 1994 නොවැම්බර් මස 07 දාතම හා අංක 4746 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන් කොට ලොට් එක්ස් වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : අලුත් යොන් වීදිය වරිපනම් අංක 216 දරන පරිශ්‍රයන් නැගෙනහිරට : මෙහි ලොට් වයි දකුණට : පරණ යෝන් වීදිය සහ බස්නාහිරට : පරණ යෝන් වීදිය වරිපනම් අංක 189 දරන පරිශ්‍රයන්, යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් නමයයි දශම පහයි හයක් (අ. 0, රූ. 0, පර්. 9.56) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන්, ප්‍රවශතාවයන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 4746 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව ඒ 1116/228 යටතේ කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

03-1186/2

---

HNB 173-13.

**හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. - නුගේගොඩ ශාඛාව**
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් යූ. එස්. කේ. හේරත් විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. නමට ලියන ලද්දාවූ ද 2005.02.11 දිනැති සහ අංක 1975 දරන බැඳුම්කරය යටතේ අය විය යුතු මුදල් ගෙවීම කඳනකන්කානම්ලාගේ මොහාන් ශ්‍රීනාත් පෙරේරා යන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින්,

හැටන් නැෂනල් බැන්ක් පී එල් සී විසින් මා වෙත පවරා ඇති බලතල අනුව අයවිය යුතු ණය මුදල් සියලු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරු

ගේ ගාස්තු ඇතුළුව සියලුම මුදල් අයකර ගැනීම පිණිස පහත සඳහන් දේපළ 2013ක් වූ අප්‍රේල් මස 22 වැනි දින පෙ. ව. 9.30 ට එම දේපළ පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළ.-* බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ පල්ලේ පත්තුවේ කොළඹ මහ නගර සභා සීමාව තුළ උතුරු වැල්ලවත්ත වසමේ අංක 43 හි වැල්ලවත්ත පිහිටි දුම්රියපල පාරේ වරිපනම් අංක 21 3/1 දරන තට්ටු නිවාස වන බලයලත් මිනින්දෝරු කේ. සෙලිවරත්නම් විසින් මැන සාදන ලද 2004.09.03 දිනැති අංක 10445 දරන සභාධිපත්‍ය පිඹුර ප්‍රකාර බෙදා වෙන් කළ 3 වන මහලේ ඒකක TF 3F1 සලකුණු කළ ඉඩම. විශාලත්වය වර්ග මීටර් එකසිය දෙකයි දශම පහයි (ව. මී. 102.5) සහ වර්ග අඩි එක්දහස් එකසිය තුනක් (ව. අ. 1103)

ඒකක TF 3 F1 තට්ටු නිවාස ක්‍රමයේ කොටසක් වන අතර එහි නොබෙදූ පොදු අගය 204ක් වේ. TF 3 F1 වන මෙම ස්ථානයට පොදු ප්‍රවේශ වීමේ මාර්ගය CE 41 වේ.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2013.03.01 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* හා 2012.03.07 වැනි දින ලක්බිම, ඩේලි මිරර් සහ තිනකරන් පුවත්පත් ද බලන්න.

*ඉඩමට පිවිසීම.* - කොළඹ ගාලු පාරේ කි. මී. 7 ක් පමණ ගමන් කර (වැල්ලවත්ත) දුම්රිය ස්ථාන පාරට දකුණට හැරී මීටර් 250ක් පමණ ගිය විට මෙම දේපළ දක්වා "මැජෙස්ටික් අපාර්ට්මන්ට්ස්" නමින් හැඳින්වෙන යථෝක්ත දේපළ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.-* වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතු ය.

1. ගැණුම් මුදලින් සියයට දහය (10%) ක් ද,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එකක් (1%)ක් ද,
3. වෙන්දේසිකරුගේ වෘත්තිමය ගාස්තු,
4. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදාහක් (රු. 2,000) ක් ද,
5. ලිපිකරු සහ සෝෂක ගාස්තු රුපියල් පන්සිය (රු. 500)ක් ද,
6. සියලුම ප්‍රචාරක වියදම් ද වේ.

ගැණුම් මුදලින් ඉතිරි සියයට අනූවක් (90%) වූ මුදල විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙත ගෙවිය යුතු ය. දින 30ක් ඇතුළත ඉතිරි මුදල නොගෙවුවහොත් ගෙවා ඇති සියයට දහයක (10%) ක මුදල අහිමි කිරීමට සහ දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු හා ලියවිලි පරීක්ෂාව සහ වෙනත් තොරතුරු ජ්‍යෙෂ්ඨ කළමනාකරු (ණය අධීක්ෂණ සහ අය කිරීම්) හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී, අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

(දුරකථන අංකය : 2661826, 2661835) ගෙන් ලබා ගත හැක.

පියරත්න මුතුකුමාරණ,
(මුළු දිවයිනටම සාම විනිසුරු),
උසාවි කොමසාරිස්, තක්සේරුකරු හා
බලයලත් වෙන්දේසිකරු.

අංක 156 - 1/13, උසාවිය පාර,
කොළඹ 12.
දුරකථන අංක : 0777- 378441,
0714 -424478.
ෆැක්ස් අංකය : 0112- 345975.

03-1158

HNB 174-13

## හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. - පිළියන්දල ශාඛාව

(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. එම්. ඩී. අනෝමා කුමාරි විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. නමට ලියන ලද්දාවූ ද 2009.12.28 දිනැති සහ අංක 634 දරන බැඳුම්කරය යටතේ අය විය යුතු මුදල් ගෙවීම දොන් ආශෝක් රන්ජන් විතාරණ යන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින්,

හැටන් නැෂනල් බැන්ක් පී එල් සී විසින් මා වෙත පවරා ඇති බලතල අනුව අයවිය යුතු ණය මුදල් සියලු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරු ගේ ගාස්තු ඇතුළුව සියලුම මුදල් අයකර ගැනීම පිණිස පහත සඳහන් දේපළ 2013ක් වූ අප්‍රේල් මස 22 වැනි දින පෙ. ව. 12.30 ට එම දේපළ පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළ.-* බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, පල්ලේ පත්තුවේ දෙහිවල ගල්කිස්ස මහ නගර සභා සීමාව තුළ කොට්ඨාස අංක 11 නැදිමාල, නැදිමාලේ ඇන්ඩර්සන් පාර ජන්සන් වත්ත වරිපනම් අංක 142/41බී මේරිලි නැමති ඉඩම වෙනුවෙන් බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. දන්තනාරායන විසින් මැන සාදන ලද 1986.02.10 දිනැති අංක 1220 දරන ලොට් සී යනුවෙන් නිරූපිත ඉඩම සහ එහි ඇති සියලු දේත්. විශාලත්වය පර්චස් හයක් (අ. 0 රූ. 0 පර්. 6)

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2013.02.22 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* හා 2013.02.26 වැනි දින ලක්බිම, සහ තිනකරන් සහ 2013.02.28 ඩේලි මිරර් පුවත්පත් ද බලන්න.

*ඉඩමට පිවිසීම.* - යොමුගත දේපලට නැදිමාලේ, පැපිලියාන පාරෙන් ඇන්ඩර්සන් පාරට ඇතුලුව හෝ කොහුවල හන්දියෙන් කළුබෝවිල රෝහල් පාරෙන් ඉහත කී ඇන්ඩර්සන් පාරට ඇතුළුව ජාත්‍යන්තර බෞද්ධ මධ්‍යස්ථානය දක්වා ගමන් කර සුසාන භූමි පරිශ්‍රය ආසන්නයේ විරුද්ධ පැත්තේ පිහිටා ඇති ජන්සන් වත්තට ඇතුලු වී එහි ඇතුලත තාර දමා ඇති රථවාහන යා හැකි පාරේ දකුණට හැරී තවදුරටත් ගොස් ප්‍රශ්නගත දේපළ වන වාහන යාහැකි ගුරුපාරේ ගියවිට අංක 142/39 පරිශ්‍රයට හරියට ම විරුද්ධ පැත්තේ මෙම දේපළට ළඟාවිය හැකි ය.

*ගෙවීමේ ක්‍රමය.-* වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතු ය.

1. ගැණුම් මුදලින් සියයට දහය (10%) ක් ද,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එකක් (1%)ක් ද,
3. වෙන්දේසිකරුගේ වෘත්තිමය ගාස්තු,
4. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදාහක් (රු. 2,000) ක් ද,
5. ලිපිකරු සහ සෝෂක ගාස්තු රුපියල් පන්සිය (රු. 500)ක් ද,
6. සියලුම ප්‍රචාරක වියදම් ද වේ.

ගැණුම් මුදලින් ඉතිරි සියයට අනූවක් (90%) වූ මුදල විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙත ගෙවිය යුතු ය. දින 30ක් ඇතුළත ඉතිරි මුදල නොගෙවුවහොත් ගෙවා ඇති සියයට දහයක (10%) ක මුදල අහිමි කිරීමට සහ දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු හා ලියවිලි පරීක්ෂාව සහ වෙනත් තොරතුරු ජ්‍යෙෂ්ඨ කළමනාකරු (ණය අධීක්ෂණ සහ අය කිරීම්) හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී, අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

(දුරකථන අංකය : 2661826, 2661835) ගෙන් ලබා ගත හැක.

පියරත්න මුතුකුමාරණ,
(මුළු දිවයිනටම සාම විනිසුරු),
උසාවි කොමසාරිස්, තක්සේරුකරු හා
බලයලත් වෙන්දේසිකරු.

අංක 156 - 1/13, උසාවිය පාර,
කොළඹ 12.
දුරකථන අංක : 0777- 378441,
0714 -424478.
ෆැක්ස් අංකය : 0112- 345975.

03-1159

---

1. ගැනුම් මිළෙන් සියයට 10% ක්,
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% (සියයට එකක) දේශීය විකුණුම් බද්ද,
3. විකුණුම් මිළෙන් 2 1/2% (සියයට දෙකහමාරක) වෙන්දේසිකරුගේ කොමිස් මුදල,
4. ලිපිකරු හා සෝෂක ගාස්තුව රු. 500,
5. විකුණුම් පිරිවැය හා වෙනත් අයකිරීම් වෙතොත් ඒවා,
6. වෙන්දේසිය සහතික කිරීම සඳහා මුද්දර ගාස්තු.

ගැනුම් මිලෙන් ඉතිරි 90% ක් ශ්‍රී ලංකා රජය හෝ වෙනත් බල අධිකාරියක් මගින් පනවා ඇති වෙනත් ව්‍යවස්ථාපිත අයබදු, තීරුබදු හෝ අයකිරීම් අදාල වේ නම් ඒවාද සමග වෙන්දේසි සිට දින 30 ක් ඇතුළත ගෙවිය යුතු වේ. හිමිකම් ඔප්පු හා වෙනත් අදාල ලිපිලේඛන කොළඹ 10, ටී. බී. ජායා මාවත, අංක 479, හැටන් නැෂනල් බැංකුව පී. එල්. සී. සහකාර සාමාන්‍යාධිකාරී (නැවත අයකර ගැනීම්) වෙතින් පරීක්ෂා කර බැලිය හැකිය. දුරකථන අංක 011-2661816 ෆැක්ස් අංක 2661835

ඩැලස් කෙලාට් ඔක්ෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
විශේෂඥ වෙන්දේසිකරුවෝ, තක්සේරුකරුවෝ
සහ දේපළ වෙළෙන්දෝ.

අංක 146/3, කල්දේරා ගාඩ්න්ස්,
දුටුගැමුණු වීදියෙන් හැරී,
කොහුවල.
දුරකථන අංක : 011-4302622, 011-4302623 ෆැක්ස් අංකය : 2856013.

03-1156

---

## හැටන් නැෂනල් බැංකුව පීඑල්සී මාලිගාවත්ත ශාඛාව
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව)

1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත යටතේ විකිණීමයි

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ ජාඇල නගර සීමාව තුල කනුවන පිහිටි "මකුල්ලගහවත්ත" නමැති බලයලත් මිනින්දෝරු එම්. ඩී. එඩ්වඩ් විසින් සාදන ලද 2007 නොවැම්බර් මස 13 දාතම හා අංක 4561 දරන පිඹුරේ ලොට් අංක 1 ලෙස ලකුණු කොට දක්වා ඇති ප්‍රමාණයෙන් අක්. 0, රූඩ් 0, පර්චස්. 16.08 ක් වූ බෙදා වෙන් කොට සීමා නිර්නය කළ ඉඩම් කොටස.

ඉඩමට ප්‍රවේශ මාර්ගය : මීගමු පාරේ ජාඇල පොලිස් ස්ථානය පසුකොට මීටර් 100 ක් පමණ ගියවිට දකුණු පස පිහිටි මෙම ඉඩම හමුවේ.

ඩී. ජී. ඩී. නිලන්ති ගුණවර්ධන යන අයට බැඳුම්කරු වශයෙන් ප්‍රදානය කළ ණය පහසුකම් වෙනුවෙන් හැටන් නැෂනල් බැංකුව පීඑල්සී වෙත උකස් කරන ලද ඉහත විස්තර කළ දේපල 2013 අප්‍රේල් 26 වෙනි සිකුරාදා පෙ.ව. 10.30 ආරම්භව පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2013.02.22 දින *රජයේ ගැසට් පත්‍රය*ද 2013.02.27 දින "ලක්බිම" හා "තිනකරන්" පුවත්පත්ද 2013.02.28 දින ඩේලිමිරර් පුවත්පතද බලන්න.

*ගෙවීම් කරන පිළිවෙල.*-සාර්ථක ගැණුම්කරු විසින් මිළ තීන්දු වූ වහාම පහත සඳහන් ගෙවීම් මුදලින් කළ යුතුය.

---

## මහජන බැංකුව - ආයතනික II අයකිරීම් ප්‍රධාන කාර්යාලය

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම්

කොළඹ දිස්ත්‍රික්කයේ දෙහිවල ගල්කිස්ස මහනගර සභා සීමාව තුල රත්මලාන පැරණි ගුවන් තොටුපල පාරේ පිහිටි වටිනා දේපලක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

පවත්නා ප්‍රමාණය : රූඩ් 01, පර් 16.17

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ දෙහිවල ගල්කිස්ස මහනගර සභා සීමාව තුල රත්මලාන පැරණි ගුවන් තොටුපල පාරේ දැනට වරිපනම් අංක 03 දරන ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. කේ. තිරුනාවුකරසු විසින් සකස් කළ 1972.05.11 සහ 1972.06.05 දින දරන අංක 1298 පිඹුරේ ලොට් අංක 3 දරන බෙදා වෙන් කළ ඉඩම් කොටස සහ එහි පිහිටි සියලු ගොඩනැගිලි හා ගස්වැල් ආදී සියලු දේ සමග අංක 1298 දරන එකී පිඹුරේ අංක 6 දරන පර්චස් 9.5 විශාල ඉඩම් කැබැල්ලේ (අඩි 15 පළල පාරක් සඳහා වූ වෙන් කිරීම) මාර්ග අයිතිය සමග මහජන බැංකුව අප වෙත පවරන ලද බලය මත 2013 අප්‍රියෙල් 23 වැනි අඟහරුවාදා පෙ.ව. 11.00 ට දේපල පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ. ශ්‍රී රම්‍යා සොයින් මැෂින් ඉන්ඩස්ට්‍රීස් ලිමිටඩ් ආයතනය විසින් මහජන බැංකුවට උකස් කරන ලද දේපලකි.

*(රජයේ ගැසට් පත්‍රයේ* 2012.11.09 දිනද, ඩේලිනිවුස්, දිනමිණ සහ තිනකරන් පුවත්පත්වල 2012.10.31 දිනද පලකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමුකරන්න)

*ගෙවීමේ ක්‍රමය*.- සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසානයේ පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය.

1. ගැණුම් මිලෙන් 10% ක් ද,
2. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට විකුණුම් මිලෙන් 1% ක්,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් ගැණුම් මිලෙන් 2 1/2% ක්,
4. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500 ක්,
5. විකුණුම් වියදම් සමග වෙනත් ගාස්තු වෙතොත් එම මුදල,
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු.

ගැණුම් මිලෙන් ඉතිරි 90% ක් වූ මුදල විකුණුම් දින සිට දින 30 ක් ඇතුළත කොළඹ 02, මහජන බැංකුව ප්‍රධාන කාර්යාලයේ 10 වැනි මහලේ පිහිටි ආයතනික II අයකිරීම් අංශයේ කළමනාකාර මහතා වෙත ගෙවිය යුතුයි.

ඉහත සඳහන් කල පරිදි සඳහන් කල මුදල් දින 30 ක් ඇතුළත නොගෙවුවහොත්, දැනටමත් ගෙවා ඇති සියලුම මුදල් ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාළ විස්තර පහත සඳහන් ලිපිනයෙන් ලබා ගත හැක.

කළමණාකරු, ආයතනික II අයකිරීම් අංශය, මහජන බැංකුව ප්‍රධාන කාර්යාලය, 10 වැනි මහල, සර් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, කොළඹ 02,

දුරකථන අංක : 0112334265, 0112481604, ෆැක්ස් අංක : 0112334265.

ඩැලස් කෙලාටිස් ඔක්ෂන්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ්,
විශේෂඥ, වෙන්දේසිකරුවෝ,
තක්සේරුකරුවෝ සහ දේපළ නියෝජිත.

අංක 146/3, කල්දේරා උද්‍යානය,
දුටුගැමුණු වීදිය,
කොහුවල,
දුරකථන අංක : 4302622, 4302623,
ෆැක්ස් අංක : 2856013 www.auctionslk.com.

03-1155

---

### හබීබ් බැන්ක් ලිමිටඩ්

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වන වගන්තිය යටතේ වූ විකිණීම

හබීබ් බැන්ක් ලිමිටඩ් විසින් මා වෙත ප්‍රදානය කරන ලද අධිකාරි බලය යටතේ මෙහි පහත සඳහන් දේපළ මා විසින් 2013 අප්‍රේල් මස 22 වැනි දින පෙරවරු 10.30ට ආරම්භවන ප්‍රසිද්ධ වෙන්දේසිය මගින් එම දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ :-

01. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ හේවාගම් කෝරලේ මැද පත්තුවේ සීතාවක ප්‍රාදේශීය සභා බල සීමාව තුළ අංගම්පිටියේ පිහිටි මැදගොඩවත්ත නම් වූ ඉඩමට බලයලත් මිනින්දෝරු ජේ. පී. අයි. අබේකෝන් විසින් මැන සාදන ලද 1996 නොවැම්බර් 8 වැනි දින අංක 5549 දරන සැලැස්මේ නිරූපණය කර ඇති ලොට් අංක 1 යනුවෙන් ලකුණු කරන ලද බෙදා වෙන් කළ ඉඩම සහ ඒ මත පිහිටි ගොඩනැගිලි සහ වෙනත් සියලු දේත් ය. එකී ඉඩම අවිස්සාවේල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක එන් 282/196 යටතේ ලියාපදිංචි කර ඇත. (ප්‍රමාණය : අක් 02, රූ. 01, පර්. 18)

02. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරලේ මැද පත්තුවේ සීතාවක ප්‍රාදේශීය සභා බල සීමාව තුළ අංගම්පිටියේ පිහිටි කහටගහවත්ත නම් වූ ඉඩමට (බලයලත් මිනින්දෝරු ජේ. පී. අයි. අබේකෝන් විසින් මැන සාදන ලද 1996 නොවැම්බර් මස 10 වැනි දින අංක 5551 දරන සැළැස්මේ නිරූපණය කර ඇති ලොට් අංක 4 හි නැවත මැනුමක් වූ) බලයලත් මිනින්දේරු ඒ. ජයසූරිය විසින් 2001 ජුනි මස 16 වැනි දින අංක 1920 දරන සැළැස්මේ නිරූපණය කර ඇති ලොට් අංක 1 යනුවෙන් ලකුණු කර ඇති ඉඩම සහ ඒ මත පිහිටි ගොඩනැගිලි සහ වෙනත් සියලු දේත් ය. එකී ඉඩම අවිස්සාවේල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක එන් 338/13 යටතේ ලියාපදිංචි කර ඇත.

(ප්‍රමාණය : අක් 0, රූ : 0, පර්. 28.20)

03. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ හේවාගම් කෝරලේ, මැද පත්තුවේ සීතාවක ප්‍රාදේශීය සභා බල සීමාව තුළ අංගම්පිටිය ග්‍රාමයේ පිහිටි කහටගහවත්ත නම් වූ ඉඩමේ මැනුමක්වූද බලයලත් මිනින්දෝරු ඒ. ජයසූරිය විසින් මැන සාදන ලද 2001 ජුනි මස 16 වැනි දින අංක 1920 දරන සැළැස්මේ නිරූපණය කර ඇති ලොට් අංක 2 යනුවෙන් ලකුණු කරන ලද ඉඩම සහ ඒ මත පිහිටි සියලු දේත් ය. එකී ඉඩම අවිස්සාවේල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක එන් 338/14 යටතේ ලියාපදිංචි කර ඇත.

(ප්‍රමාණය : අක් 0, රූ. 0, පර්. 8.50)

04. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ හේවාගම් කෝරලේ මැදපත්තුවේ අංගම්පිටිය ග්‍රාමයේ පිහිටි කහටගහවත්ත නම් වූ ඉඩමට බලයලත් මිනින්දෝරු සහ සමමිතිකරු ඒ. ජයසූරිය විසින් සාදන ලද 1998 ජුනි 29 දින අංක 966 දරන පිඹුරේ නිරූපණය කර ඇති ලොට් අංක 1 යනුවෙන් ලකුණු කර ඇති බෙදා වෙන් කළ ඉඩම සහ ඒ මත පිහිටි සියළු දේත් ය. එකී ඉඩම අවිස්සාවේල්ල ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ අංක එන් 192/124 යටතේ ලියාපදංචි කර ඇත.

(ප්‍රමාණය : අක් 0, රූඩ් 0, පර්. 08)

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එම්. පී. රාජපක්ෂ විසින් හබීබ් බැන්ක් ලිමිටඩ්හි වාසියට සහතික කරන ලද 2006 දෙසැම්බර් මස 12 වැනි දින අංක 135 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම උකස්කරු වශයෙන් මොසින් අයුබ් මිර්සා විසින්ද බන්ධනදායී වශයෙන් ඉසඩ් එම් වර්ටිකෝ (ප්‍රයිවෙට්) ලිමිටඩ් සමාගම විසින්ද පැහැර හැර ඇත.

*යෝජනා සම්මුතිය පිළිබඳ දැන්වීම සඳහා*.- කරුණාකර 2013 මාර්තු මස 15 වැනි දින *රජයේ ගැසට් පත්‍රයද* 2013 මාර්තු මස 16 වැනි දින ද අයිලන්ඩ්, දිවයින සහ තිනකරන් පුවත්පත් ද බලන්න.

*දේපළට ප්‍රවේශවීම*.- කොළඹ නගරයේ සිට හයිලෙවල් පාර දිගේ කිලෝමීටර් 34 1/2 පමණ ගිය විට අංක 35/2 බෝක්කුව අසළ මීපේ හංදිය හමුවේ. එතැනින් දකුණට හැරී අංගම්පිටිය බී 285 මහපාර දිගේ කිලෝමීටර් 3 කණුව දක්වා ගමන් කර තවත් මීටර් 175 පමණ ගමන් කර අංක 4/1 බෝක්කුව පසු කල විට බෝගහ හංදිය හමුවේ. එතැනින් වමට

හැරී තාරපාර දිගේ හල්පේ දෙසට මීටර් 75 පමණ ගමන් කළ විට පාරේ දකුණු පැත්තේ කර්මාන්ත ශාලා පරිශ්‍රය ඇත.

*මුදල් ගෙවීමේ ක්‍රමය.-* පහත දැක්වෙන මුදල් වෙන්දේසිකරුට මුදලින් ගෙවිය යුතුය.

1. මිලදී ගැනීමේ මිලෙන් 10% ක්,
2. පළාත් පාලන ආයතනයට ගෙවනු ලබන 1% ගාස්තුව සහ ඒ මත වැට් බද්ද,
3. මිලදී ගැනීමේ මිලෙන් 2.5% වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් ගෙවිය යුතු ය. (සියයට දෙකයි දශම පහක්),
4. විකිණීම පිළිබඳ මුළු පිරිවැය සහ වෙනත් ගාස්තු,
5. වෙළඳ ප්‍රචාරක ගාස්තුවල පිරිවැය,
6. ලිපිකරු සහ ප්‍රකාශකරුගේ ගාස්තු රු. 500,
7. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස්වරයාගේ සහතික කිරීමේ ගාස්තු.

*විකුණුම් කොන්දේසි .-*මිලදී ගැනීමේ මිලෙන් ඉතිරි 90% ක මුදල වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත බැංකුවට ගෙවිය යුතු ය. ඉහත නියම කර ඇති පරිදි එකී මුදල දින 30 ඇතුළත ගෙවනු නොලැබුවහොත්, ඒ වන විට ගෙවා ඇති මිලදී ගැනීමේ මිලෙන් 10% ක මුදල බැංකුව සතු කිරීමටත්, දේපළ නැවත විකිණීමටත් බැංකුවට අයිතිය ඇත.

ඔප්පු සහ වෙනත් අදාළ ලේඛන කොළඹ 03, ධර්මපාල මාවතේ අංක 70 ඒ දරන ස්ථානයේ හබීබ් බැන්ක් ලිමිටඩ් හි ණය පරිපාලන කළමනාකාර මහතාගෙන් පරීක්ෂාකර ලබා ගත හැකිය.

*දුරකථන අංකය :* 0112370391 දිගුව 312.

පී. කේ. ඊ. සේනාපති,
උසාවි කොමසාරිස්, තක්සේරුකරු සහ
බලයලත් වෙන්දේසිකරු.

දුරකථන අංකය : 011-2873656, ජංගම : 0777-672082 ෆැක්ස් : 011-2871184.

03-1165

---

**කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී - පිටකෝට්ටේ ශාඛාව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී (ලියාපදිංචි අංක පීකිව් 116) මගින් මා වෙත පවරා ඇති බලය ප්‍රකාර ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

බලයලත් මිනින්දෝරු ඒ. ආර් ද සිල්වා විසින් 2002.10.06 දින මැන සාදන ලද පිඹුරු අංක 1340 හි ලොට් 2 වශයෙන් දැක්වෙන බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිටි කෝරළේ පල්ලේපත්තුවේ ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභා සීමා තුල නාවල පරණ පාරේ පිහිටි අංක 93/2ඒ දරන කෝන්ගහවත්ත සහ අඹගහවත්ත නමැති ඉඩමේ සඳහන් වෙන් කරන ලද ලොට් 2 ද, පර්චස් විසි එකයි දශම තුනයි බිංදුවයි (අ. 0, රූ. 0, පර්. 21.30) බලයලත් මිනින්දෝරු ඒ. ආර් ද සිල්වා විසින් 2002.10.06 දින මැන සාදන ලද පිඹුරු අංක 1340 හි ලොට් 3 දරන නාවල පිහිටි කෝන්ගහවත්ත සහ අඹගහවත්ත නමැති ඉඩම් කොටස (අඩි 10 ක් පළල පාරක් සඳහා වෙන් කිරීමකි) ලොට් 3 ට මායිම්ව, පර්චස් බිංදුවයි තුනයි දශම බිංදුවයි දෙකයි (අ. 0, රූ. 0, පර්. 03.02) නාවල, පරණ පාරේ, අංක 93/2, යන ස්ථානයේ ලියාපදිංචි කාර්යාලය පිහිටි සීමාසහිත නා ට්‍රී කේටරිස් (පුද්ගලික) ණයකරු හැටියට සහ කොටදූව ආරච්චිගේ විරාන් ඉන්දික පෙරේරා උකස්කරු හැටියටද කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී ට උකස් කරන ලද ඉහත සඳහන් කළ දේපළ වර්ෂ 2013 ක් වූ අප්‍රේල් මස 23 වන දින පෙ.ව. 11.30 ට ඉහත ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2012.10.25 වන දින *රජයේ ගැසට් පත්‍රය* ද 2012.10.25 වන දින ලක්බිම, ද අයිලන්ඩ් සහ වීරකේසරී පුවත්පත් ද බලන්න. විකිණීම පිළිබඳ දැන්වීම සඳහා 2013.03.28 වන දින *රජයේ ගැසට් පත්‍රය* ද 2013.04.01 දින ලක්බිම, සහ ද අයිලන්ඩ් පුවත්පත් බලන්න.

*ඉඩමට පිවිසීම.-* නාවල හංදියේ සිට නාවල පාරේ රාජගිරිය දෙසට මීටර් 800 ක් පමණ ගියවිට දකුණට හැරුණු පසු 4 වන පටුමග හමුවේ. එම පාරේ මීටර් 100 ගියපසු දකුණට හැරණුවිට පරණ පාර හමුවේ. එම පාරේද මීටර් 150 ක් පමණ ගියපසු වමට හැරුණු විට අඩි 20 ක් පළල පුද්ගලික පාරක් හමුවේ. (පිඹුරු පතේ පෙන්වා ඇති) එම පාරේ මීටර් කිහිපයක් කෙලවරටම ගිය පසු දකුණට හැරී අඩි 10 ක් පළල පාර හමුවේ. (පිඹුරු පතේ පෙන්වා ඇති) එම පාරේ අදාල දේපල ඉදිරියෙන් පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය .-* විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතුය.

01. ගැණුම් මිලෙන් සියයට දහයක් (10%),
02. පළාත් සභා අයබදු සඳහා සියයට එකයි (1%),
03. වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%),
04. නොතාරිස් ගාස්තුව රු.2000,
05. ලිපිකරු හා සෝෂක වේතනය රු. 500,-෩95623
06. වෙන්දේසිය සඳහා වැය කරන ලද සියළුම ප්‍රචාරක වියදම්
07. ගැණුම් මිලෙන් ඉතිරි සියයට අනූව (90%) විකිණීමේ දින සිට දින 30 ක් තුලදී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී හි ප්‍රධාන කාර්යාලයේ හෝ පිටකෝට්ටේ ශාඛාවේ තැන්පත් කළ යුතුය.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වැඩි විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න :-

එල්. බී. සේනානායක,
සාම විනිසුරු, බලයලත් ජොෂ්ඨ වෙන්දේසිකරු,
තක්සේරුකරු, උසාවි කොමසාරිස්.

අංක 182, 3 වන මහල, උසාවි පාර,
කොළඹ 12,
දුරකථන/ෆැක්ස් අංකය : 011-2445393
දුරකථන අංකය : 011-2396520
ඊමේල් :senaservice @sltnet.lk

කළමණාකරු,
කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී,
අංක 539, කෝට්ටේ පාර,
පිටකෝට්ටේ.
දුරකථන අංක 011-2864163/011-2864164
ෆැක්ස් අංකය : 011-2864166

03-1098

**බස්නාහිර පළාත් වාණිජ මහාධිකරණය කොළඹ දී පැවති විභාගය**

පබ්ලික් බැංකුව බර්හැඩ් මෙනාරා පබ්ලික් බැන්ක් 146, ජලාන් අම්පැන්ග් 50450 ක්වාලාලම්පූර් මැලේසියාව අංක 340, ආර්. ඒ ද මැල් මාවත, කොළඹ 03,

නඩු අංක :
ස්වභාවය :
උකස් බැඳුම්කරය
ක්‍රමවේදය : සාමාන්‍ය
වටිනාකම :
රු. 16,000,000

පැමිණිලිකරු............................

සහ

1. ෆිල්ම් ලොකේෂන්ස් සර්විසස් (පෞද්ගලික) සමාගම
   අංක 35/3 ෆිල්ෆර්ඩ් ක්‍රසෙන්ට්
   කොළඹ 07

2. අරිච්චන්ද්‍රන් කුමාර් රත්නම්
   අංක 35/3, ගිල්ෆර්ඩ් ක්‍රසෙන්ට්
   කොළඹ 07

විත්තිකරුවන්............................

**මුහුදට මුහුණලා පිහිටි වටිනා හිස් ඉඩමක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම**

අංක 708, පමුණුගම පාර, තලාහේන, මීගමුව.

ඉඩමේ ප්‍රමාණය : අක් 01, රූඩ් 0, පර් 33 (පර්චස් 193)

අප විසින් 2013 අප්‍රේල් මස 06 වැනි දින (සෙනසුරාදා) පෙ.ව. 10.00 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළ වෙත පිවිසීම.-* පැලියගොඩ මංසන්ධියේ සිට මීගමුව පාරේ ජාඇල නගරය පසු කරමින් තෙඩුල්ල මංසන්ධිය දක්වා පැමිණෙන්න. එතැනින් වමට ඇති බෝපිටිය/පමුණුගම පාරේ බෝපිටිය/පමුණුගම නගරය දක්වා ගොස් පමුණුගම මීගමුව පාරේ අංක 708 තලාහේන යන ස්ථානයේ පිහිටි ඉහත කී දේපල වෙත ලඟාවන තුරු ගමන් කරන්න.

*ගෙවීමේ ක්‍රමය.-* මිළ තීන්දු වූ වහා ම සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසානයේ පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතු ය.

1. ගැනුම් මිලෙන් 10% ක් (සියයට දහයක්)
2. ගැනුම් මිලෙන් 90% (සියයට අනූව) ක් වූ ඉතිරිය වෙන්දේසි දින සිට මාසයක් ඇතුළත ගෙවිය යුතු වේ.
3. ඉහත සඳහන් කල පරිදි කාලය ඇතුලත ඉහත සඳහන් කරන ලද මුළු මුදල ගෙවනු නොලැබුවහොත් දැනටමත් ගෙවනු ලැබ ඇති විකුණුම් මිලෙන් 10% ක මුදලක් බැංකුව සන්තක කිරීමේ සහ දේපළ නැවත වෙන්දේසි කිරීමේ බලය බැංකුව සතුවේ.

ඔප්පුව සහ අනෙකුත් නීතිමය විමසීම් සඳහා අමතන්න : දිසානායක අමරතුංග ඇසෝසියේට්ස් අංක 78, රොස්මීඩ් ප්ලේස්, කොළඹ 07.

දුරකථන අංක : 011-2671671 ෆැක්ස් : 011-2696588

විකුණුම් සම්බන්ධ විමසීම් සඳහා අමතන්න නවින්ද 0777-372000

"ඉහත වෙන්දේසිය පෙර දැනුම්දීමකින් තොරව නවතා ගැනීමේ/අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි"

ෂොක්මන් සහ සමරවික්‍රම,
එකම රටක්, එකම වෙන්දේසිකරුවෙක්
වසර 121 ක සේවා විශිෂ්ඨත්වය සමගින්.

*නගර කාර්යාලය හා ප්‍රදර්ශනාගාරය,*
අංක 290, හැව්ලොක් පාර,
කොළඹ 05,
දුරකථන අංක : 011-2502680, 2585408
දුරකථන/ෆැක්ස් 011-2588176
ඊමේල් :schokman@samera1892.com.

*ප්‍රධාන කාර්යාලය:*
අංක 24 ටොරින්ටන් පාර,
මහනුවර,
දුරකථන අංකය : 081-2227593
දුරකථන/ෆැක්ස් 081-2224371
ඊමේල් :schokmankandy@sltnet.lk

වෙබ් අඩවිය :www.sandslanka.com.

03-1167

---

**මහජන බැංකුව - ඌරගස්මන්හන්දිය ශාඛාව**

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

2013.04.17 වැනි දින පෙ.ව. 10. 30 ට මෙහි පහත විස්තර වන දේපළ එකී දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

**දේපල පිළිබඳ විස්තර**

දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කයේ බෙන්තොට වලල්ලාවිට කෝරලේ ඌරගස්මන්හන්දියේ පිහිටි කරකැටිය වත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු අයි. කොටබගේ මහතා විසින් මැන සාදන ලද 2008.10.05 දිනැති අංක 879/2008 දරන පිඹුර පරිදි ලොට් ඒ දරන අක්කර එකයි රූඩ් දෙකක් (අක්. 01, රූඩ් 02, පර්. 0) විශාල ඉඩම සහ එහි පිහිටි වැව්ලි ගොඩනැගිලි ආදී සියලු දේද වේ.

වැඩි විස්තර සඳහා 2011.09.02 වැනි දින *රජයේ ගැසට් පත්‍රයේ* ද 2011.11.02 වැනි දින දිනමිණ ඩේලිනිවුස් හා තිනකරන් යන පුවත්පත් වල පලකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපොළට පිවිසීමේ මාර්ගය :-* ඌරගස්මන්හන්දිය සිට අළුත්ගම පාරේ මීටර් 100 ක් පමණ ගියවිට හමුවන ජයවර්ධන ස්ටෝර්ස් අසළින් දකුණට ඇති පාරේ මී. 50ක් පමණ ගිය විට වම්පස පිහිටි (Re building foundation) ගොඩනැගිල්ල ඉදිරිපිට පිහිටි දේපළ වේ.

*ගෙවීමේ ක්‍රමය.-* සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසානයේ පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය.

1. ගැණුම් මිළෙන් 10%ක් ද,
2. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට විකුණුම් මිළෙන් 1% ක් ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිළෙන් 2 1/2ක් ද,
4. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500 ක් ද,
5. විකුණුම් වියදම් හා වෙනත් ගාස්තු වෙතොත් එම මුදල ද,
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු ද වේ.

ගැණුම් මිළෙන් ඉතිරි 90% ක් වූ මුදල විකුණුම් දින සිට දින 30 ක් ඇතුලත ගාල්ල පහල ඩික්සන් පාරේ අංක 22 දරන ස්ථානයේ පිහිටි මහජන බැංකුව ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලයෙන් ප්‍රාදේශීය කළමනාකාර මහතාට ගෙවිය යුතු ය.

දුරකථන අංක 091-2232311, 2234785, 2234171, හා 2223564 ෆැක්ස් අංක 091-2232230 හිමිකම් ඔප්පු සහ වෙනත් අදාල විස්තර ඉහත කී ලිපිනයෙන් ලබාගත හැක.

ඉහත සඳහන් කරන ලද පරිදි සඳහන් කළ මුදල් දින 30 ක් ඇතුලත නොගෙවුවහොත් දැනටමත් ගැණුම් මිළෙන් ගෙවා ඇති 10% ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපල විකිණීමට බැංකුවට අයිතිය ඇත.

ජී. පී. ආනන්ද (සාම විනිසුරු),
බලයලත් වෙන්දේසිකරු,
උසාවි කොමසාරිස් හා තක්සේරුකරු.

කුරුදුවත්ත,
වල්ගම,
මාතර.
දුරකථන අංක : 041-2228731, 071-4438516.

03-1115

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.